# COVID-19 ස්වයං හුදෙකලාවට සිදුවන වෙනස්කම්

## ඔබට COVID-19 ආසාදනය ඇති බවට පරීක්ෂණයකින් සනාථවුණි නම්, ඔබ ස්වයං හුදෙකලාවිය යුතු නැත. ඔබගේ දරුණු රෝග ලක්ෂණ (නාසයෙන් සොටු ගැලීම, උගුරේ ආසාදන, කැස්ස සහ උණ) නැතිවන තෙක් නිවසේ රැඳී සිටීම නිර්දේශ කරයි.

ඔබ නිවසින් පිටව යන්නේ නම්:

- ඇතුලත ස්ථානවල සිටින විට හෝ මහජන ප්‍රවාහන සේවාවල යන විට මුව ආවරණයක් පළඳින්න
- විශාල ජන හමු සහ ජනාකීර්ණ ඇතුලත ස්ථාන මඟ හරින්න
- අවම වශයෙන් දින 7 ක් යන තෙක්, දරුණු ලෙස රෝගාතුරවීමේ වැඩි අවධානමක් ඇති අය, රෝහලක සිටින අයෙකු, හෝ වැඩිහිටි නිවසක හෝ ආබාධිත රැකවරණ පහසුකමක සිටින අයෙකු හමුවීමට නොයන්න
- ඔබගේ රැකියා ස්ථානයට යායුතු දිනය සම්බන්ධයෙන් ඔබගේ සේවායෝජකයා සමඟ කථා කරන්න

ඔබට සෙම්ප්‍රතිශ්‍යාව හෝ උණ සම්බන්ධ රෝග ලක්ෂණ ඇතිනම්, කරුණාකර නිවසේ රැඳී සිට පරීක්ෂා කරවා ගන්න. ඔබ COVID-19 ඇන්ටි වයිරල් බෙහෙත් ලබා ගැනීමට සුදුසුකම් ඇතිනම්, ඔබගේ රෝග ලක්ෂණ ඇතිවනවාත් සමඟම පරීක්ෂා කරවා ගැනීම වැදගත්වේ. ඔබට පරීක්ෂණයෙන් COVID-19 රෝගය ආසාදනය නොවුණු බව තහවුරු වුවද, අසනීප කාලයේදී නිවසේ රැඳී සිටින්න, මේ මගින් ඔබගේ සමීපතමයන් සහ ප්‍රජාවට ආසාදන ඇති නොකල හැකිය.

තව දුරටත් ආසාදනය ඇති බවට රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂණයකින් තහවුරු වුවද, ඒ බව ලියාපදිංචි කිරීම අත්‍යාවශ්‍ය නොවුවද, NSW Health මගින් ඉල්ලා සිටින්නේ Service NSW සමඟ ලියාපදිංචි වන ලෙසටය. හේතුව ලියාපදිංචිය මගින් ඔබට සෞඛ්‍යය සේවා සහ වෙනත් උපකාර ලබා ගත හැකි වීමය.

**ඔබට කිසියම් සෞඛ්‍යය ගැටළු ඇතිනම් සහ භාෂා උපකාර අවශ්‍ය නම්, දුරකථන අංක 131 450 ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව (TIS) අමතා, දුරකථන අංක 1800 022 222 ඔස්සේ Healthdirect ඉල්ලා සිටින්න.**



October 2022 © NSW Health. SHPN (COHS) 220923